රහසිගතයි

Ministry of Power & Renewable Energy
14 JUL 2017
Planning & Development Division

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
**OFFICE OF THE CABINET OF MINISTERS**

CABINET DECISION — අමාත්‍ය මණ්ඩල තීරණය — அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
මුදල් හා ජනමාධ්‍ය ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/1345/727/027
2017 ජූලි මස 12 දින.

14 JUL 2017

ක්‍රියා කළ යුතු : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්.

හරිත බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2892/2893 (SF)-SRI ණය ගිවිසුමෙහි වලංගු
<u>කාල සීමාව දීර්ඝ කිරීම පිණිස වන ඉල්ලීම</u>

(විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-06-20 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන)

2017 ජූලි මස 04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:

25. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1345/727/027 වූ, "හරිත බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2892/2893 (SF)-SRI ණය ගිවිසුමෙහි වලංගු කාල සීමාව දීර්ඝ කිරීම පිණිස වන ඉල්ලීම" යන මැයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-06-20 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන - (අමප අංක 12/1030/504/090 පිළිබඳව වූ 2012-07-25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සටහන මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→ 2

(i) ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරනු ලැබ ඇති හරිත බලශක්ති සහ ජාල කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2892/2893 (SF)-SRI ණය ගිවිසුමෙහි වලංගු කාල සීමාව, මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණවල දක්වා ඇති ආකාරයට, 2017-06-30 දින සිට තවත් මාස 24කින් දීර්ඝ කිරීම පිණිස අනුමැතිය ලබා දීම; සහ

(ii) මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණවල අවසන් ඡේදයේ අවධාරණය කරනු ලැබ ඇති කරුණු සැලකිල්ලට ගෙන, ඉදිරියේදී ඒ අනුව ක්‍රියා කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ බලධාරීන්ට නියම කරන මෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දීම.

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - සටහනේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සටහනේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - සටහනේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය